ඉඩම් අත්කරගැනීමේ ක්‍රමවේදය - Land Acquisition Procedure

P.B.W. Sameera Prasad

BSc (Agri) sp Hons, MPAM, MAIR

Director (Land Acquisition)

Eminent Domain

- මහජන ප්‍රයෝජනයක් (public purpose) සඳහා පෞද්ගලික දේපල අනිවාර්යෙන්ම අත්කර ගැනීමට රාජ්‍යයට තිබෙන ස්වෛරී බලය (sovereign power).
- මූලික අංග 03

i. පොදු මහජන අරමුණ (public purpose) - උදා. මාර්ග, රෝහල්, පාසැල්

ii. නීත්‍යානුකූල ක්‍රියාපටිපාටිය (due process of law)

iii. සාධාරණ වන්දිය (fair compensation)

ඉඩම් අත්කරගැනීම - Land Acquisition

පොදු මහජන අවශ්‍යතාවයන් (රජයේ සංවර්ධන කාර්යයන්) සඳහා රාජ්‍ය ආයතනයකට පෞද්ගලික ඉඩමක් පවරා ගැනීමට අවශ්‍ය වූ විට 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත මගින් නියමානුකූල කරන ලද ඉඩම් අත්කරගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කරමින් එම අවශ්‍යතාවය ඉටුකර දීම.

When it is necessary to acquire a private land for a government institution for public purposes (government development activities), fulfilling that requirement by following the land acquisition procedure regulated under the Land Acquisition Act No. 9 of 1950.

ඉඩම් අත්කරගැනීමේ ක්‍රියාවලියට අදාළ නීතිමය ප්‍රතිපාදන - Legal provisions pertaining to land acquisition

1. 1950 අංක 09 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත සහ එහි නියෝග හා රෙගුලාසි- Land acquisition act of No. 09 of 1950 and Orders and Regulations
2. පනතේ සංශෝධන - Amendments to the Act

   1954 අංක 39
   1955 අංක 22
   1961 අංක 60
   1964 අංක 05
   1964 අංක 28
   1969 අංක 20
   1971 අංක 48
   1979 අංක 08
   1986 අංක 13
3. චක්‍රලේඛ - Circulars
4. නීතිපති උපදෙස් - Attorney General's instructions

ඉඩම් අත්කරගැනීමට අවශ්‍යවන රාජ්‍ය සහ රාජ්‍ය අනුබද්ධිත ආයතන - Public institutions that require land acquisition

රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු - Ministries and Departments

සංස්ථා, මණ්ඩල වැනි ව්‍යවස්ථාපිත ආයතන - Statutory bodies such as Corporations, Boards

පළාත් සභා සහ පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා, මහ නගර සභා, නගර සභා) – Provincial Councils and Local Government Authorities (Pradeshiya Sabha, Municipal councils, Urban councils)

ඉඩම් අත්කරගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ ආයතන - Institutions involved in land acquisition

- ඉඩම් අමාත්‍යාංශය - Ministry of Lands
- ඉල්ලුම්කාර අමාත්‍යාංශය - Applicant Ministry
- ඉල්ලුම්කාර ආයතනය - Applicant institute
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - Divisional Secretariat
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව - Survey Department
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව - Department of Government printing
- තක්සේරු දෙපාර්තමේන්තුව - Valuation Department
- වන්දි සමාලෝචන මණ්ඩලය - Compensation review board
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - Registrar General's Department
- අධිකරණය -Court
- නීතිපති දෙපාර්මේන්තුව - Attorney General's Department
- පොලිස් දෙපාර්තමේන්තුව - Police Department

ප්‍රාරම්භක විමර්ශනය - Preliminary investigation

පොදු මහජන අරමුණක් සඳහා අත්කරගැනීමට සුදුසු ඉඩම් පිළිබඳව සොයාබැලීමට ඉඩම් නියෝග 248 අනුගමනය කිරීම

Investigations for selecting land for public purpose according to Land Order 248

- ඉඩම් පිළිබඳ සන්සන්දනාත්මක විමසුමක් කිරීම - Conducting a comparative study on land
- ඉඩමේ යෝග්‍යතාවය - Feasibility of land
- ඉඩමේ ඵලදායිතාව - Productivity of Land
- ඉඩම් ලබාදීමට කැමති අය සිටීද යන්න - Doners
- ඉඩම් හිමිකරුට පීඩාකාරී තත්වයක් ඇතිවේද යන්න - Whether the landowner will face any hardship
- ප්‍රදේශයේ සංවර්ධන සැලසුම්වලට එකඟවේද යන්න -Whether it is compatible with the regional development plans
- පුද්ගලයකු සතු එකම ඉඩම අත්කර නොගැනීම -Avoiding the acquisition of the sole land owned by an individual.

ප්‍රාරම්භක විමර්ශනය - Preliminary investigation (Cont.)

ගම් පුළුල් කිරීම - Village Expansion

- ඉඩම් කච්චේරිවලින් තේරීම් කළ අයගේ ප්‍රමාණය සලකා බැලීම - Consider the requirement of lands according to the number of people selected through the Land Kachcheri
- ගම් පුළුල් කිරීම සඳහා මීට මීට පෙර අත්කරගත් ඉඩම් බෙදා නොදී ඇත්ද යන්න - Does previously acquired lands for village expansion have not distributed?
- මාර්ග පහසුව, පානීය ජලය ඇතිබව, විදුලි බලය ලබාගත හැකි බව
- අනෙකුත් පහසුකම්
- අවම බිම් ප්‍රමානය අක්කර 10ක් විය යුතුයි.
- අයදුම්පත්‍රය ඉඩම් කොමසාරිස් ජනරාල් මගින් ඉදිරිපත් කල යුතුයි.

අවශ්‍ය නිර්දේශ සහ අනුමැතීන් - Required recommendations and Approvals

- වැවිලි භෝග සහිත ඉඩමක් සඳහා අදාළ අමාත්‍යාංශයේ එකඟතාව ලබා ගැනීම - Obtaining the approval of the relevant ministry when the land contains plantational crops
- කුඹුරු ඉඩම් සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම - Obtaining the approval of the Department of Agrarian Services for paddy lands
- පුරාවිද්‍යා භූමි ආශ්‍රිතව පවතීනම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය -Obtaining approval from the Department of Archaeology if the land is located within or associated with an archaeological site
- ව්‍යාපෘතියට අදාලවන පරිදි වෙනත් අනුමැතීන් සහ නිර්දේශ - Other approvals and recommendations as per the project

වන්දි ගෙවීම් සහ වෙනත් වියදම් සඳහා ප්‍රතිපාදන - Paying compensation and other expenses

❑රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු - Ministries and departments

මුදල් රෙගුලාසි 53 යටතේ ඉඩම් අමාත්‍යාංශයේ සාමූහික ප්‍රතිපාදනවලින් වන්දි ගෙවීමට අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීම -Obtaining the approval of the Director-General of National Budget to pay compensation from the collective provisions of the Ministry of Lands under Financial Regulation 53

❑ව්‍යවස්ථාපිත ආයතන - Statutory bodies

තක්සේරුගත මුදලින් 25%ක් හෝ රු 50,000 යන මුදලින් වැඩි අගය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කිරීම - Deposit higher value among 25% of the estimated amount and Rs. 50,000 with the Divisional Secretary

❑ පළාත් සභා,පළාත් පාලන ආයතන - Provincial Councils and Local Govt. Authorities

තක්සේරුගත මුලු මුදල ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කිරීම - Deposit the total amount of estimated cost with the Divisional Secretary

ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව ඉදිරිපත් කිරීම - Submission of Land Acquisition Proposal

අත්කරගැනීමේ යෝජනාවේ අන්තර්ගත විය යුතු ලේඛන - Documents that should be included in the acquisition proposal

- අයදුම්පත්‍රය - Application
- විස්තර ප්‍රකාශය - Detailed Description
- මානක සැලැස්ම - Plan
- වන්දි ගෙවනු ලබන ආකාරය තහවුරු කරන ලේඛණ - Documents to confirm how the compensation will be paid
- ව්‍යාපෘතියට අදාලවන අනුමැතීන් සහ නිර්දේශ - Approvals and recommendations as per the project

අත්කරගැනීමේ යෝජනාව කට්ටල තුනකින් ඉදිරිපත් කළ යුතුවේ - The acquisition proposal should be submitted in three sets.

2 වගන්තිය යටතේ නියමය - Section 2 order

ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගේ නියමය මත අදාල ඉඩම අත්කරගන්නා බවට මූලික දැනුම් දීම සහ මිනුම් කටයුතු සිදුකිරීමට අවශ්‍ය නෛතික පසුබිම ස්ථාපනය කිරීම - To inform that the land is being acquired by the order of minister in charge of the subject of Lands and to establish the necessary legal background to carry out the survey activities.

ප්‍රාදේශීය ලේකම් විසින් මහජන කාර්යයය නිවරදිව සඳහන් කරමින් 2 වගන්තිය යටතේ භාෂාත්‍රෙයන්ම දැන්වීම් ප්‍රදර්ශනය කිරීම (ජී ඒ එල් 33 ආකෘතිය) - Exhibition of Notices in all three language under section 2 defining the public purpose accurately by the DS

ප්‍රගමන අනුරේඛණයක් සකස් කිරීමට ජී.ඒ.එල්. 8 ආකෘතියෙන් මැනුම් ඉල්ලීමක් මිනින්දෝරු අධිකාරී වෙත යොමු කිරීම.

ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදිය යුතු ලේඛන - Documents to be submitted by Divisional Secretary

- *භාෂාත්‍රයේ දැන්වීම් කට්ටලය, දැන්වීම් ප්‍රදර්ශන වාර්තාව, මැනුම් නියෝගය, ප්‍රගමන අනුරේඛනය*
- *Set of notices in 3 languages, Exhibition report, Survey requisition, Advance Tracing*

4 වගන්තිය යටතේ නියමය - Section 4 order

- අත්කරගැනීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසාදීම - Allowing parties to submit objections related to the acquisition.

- ප්‍රාදේශීය ලේකම් විසින් භාෂාත්‍රයේ දැන්වීම් (ජී.ඒ.එල්.31 ආකෘතිය) සහ දැන්වීම් ප්‍රදර්ශන වාර්තාව ඉඩම් අමාත්‍යාංශයට එවීම.- The Divisional Secretary submit the Set of notices in all three languages and exhibition report to the Land Ministry.

- ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අමාත්‍යාංශ වෙත ලැබෙන අභියාචනා ඉල්ලුම්කාර අමාත්‍යාංශය වෙත යැවීම - Divisional Secretariat and the Ministry of Lands forward objections and appeals if received, to the applicant Ministry

- ඉල්ලුම්කාර අමාත්‍යාංශය විසින් විරෝධතා පරීක්ෂණ පවත්වා 4(4) නිර්දේශ ඉදිරිපත් කිරීම -The applicant ministry conducts the objection inquiry and submits recommendations under Section 4(4).

5 වගන්තිය යටතේ ප්‍රකාශය නිකුත් කිරීම - Declaration under section 5

- සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක අත්කරගැනීමක, අත්කර ගැනීම පිළිබඳ ස්ථිර තීරණයකට පැමිණෙන්නේ මෙම අවස්ථාවේදීය.

- ඉඩම අත්කර ගැනීමේ කටයුතු ඉදිරියට සිදුකරගෙන යන බව ප්‍රකාශයට පත් කිරීම - Publishing that the acquisition of the land is proceeding further

- 5 වගන්තිය යටතේ ප්‍රකාශය භාෂාත්‍රයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම - Gazette the declaration under section 5 in all three languages

- භාෂාත්‍රයේ ගැසට් පත්‍රය ඉඩමට හිමිකම් කියන පාර්ශව වෙත ලබාදීම - Hand over copies of the gazette to interested parties to the land

- ඉඩමේ හා ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කිරීම -Exhibition on the land and in nearby public places

- 6 වගන්තිය යටතේ මූලික පිඹුර සැකසීමට මැනුම් ඉල්ලීම ලබා දීම - Survey requisition for the preliminary plan under section 6 -

7 වන වගන්තිය යටතේ කටයුතු කිරීම - Process under section 7 -

- අත්කරගන්නා ඉඩමට සම්බන්ධතා ඇති පාර්ශවයන් වෙත අත්කරගැනීමේ නිලධාරී ඉදිරියේ වන්දි සඳහා හිමිකම් පරීක්ෂණයට සහභාගී වී ඉඩම සඳහා ඇති අයිතිය තහවුරු කරන ලෙස දැනුම් දීම - Inform interested parties to attend the Inquiry to claims for compensation and claim the ownership to the land

- මූලික පිඹුර පදනම් කරගෙන ප්‍රාදේශීය ලේකම් විසින් 7 වගන්තිය යටතේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීම -Divisional Secretary Publish gazette notice under section 7 based on the preliminary plan

- එම දැන්වීම තේ‍ර භාෂාවෙන් පුවත්පත්වල පළ කිරීම - Publish section 7 notices in news papers

- එම දැන්වීම් පිටපත් අදාළ ආයතන වලට යැවීම - Send copies of above notices to related institutes

9 වගන්තිය යටතේ වන්දි සඳහා හිමිකම් පරීක්ෂණය- Inquiry into claims for compensation under section 9

- 7 වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමේ සඳහන් දින නියමිත වේලාවට පරීක්ෂණ පැවැත්වීම - Conducting inquiry as scheduled in gazette advertisement on section 7
- පරීක්ෂණයේදී ඉදිරිපත් වන ලියවිලිවල සහතික පිටපත් ලබා ගැනීම - Obtaining certified copies of documents presented at the inquiry
- සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ / දිවුරුම් සහතික ලබා ගැනීම -Obtaining statements/affidavits from witnesses
- පරීක්ෂණ කල් දමන අවස්ථාවල පරීක්ෂණ දිනය නිවැරදිව දැනුම් දීම - Notifying the date of inquiry accurately in case of postpone
- *හිමිකම් පරීක්ෂණයට කැඳවීම*
- *හිමිකම් පරීක්ෂණ වාර්තාව*

10 වගන්තිය යටතේ කටයුතු කිරීම - Procedures under section 10

අයිතියේ ස්වභාවය, අයිතියේ ප්‍රමාණය සහ හිමිකරු තීරණය කිරීම - Determine the nature of ownership, amount/extent of ownership and the rightful owner(s)

- හිමිකම් නොදැක්වූ කොටස් පැහැදිලිව දැක්වීම -Clearly delineating portions for which ownership has not been claimed by anyone.
- අත්කර ගත් මුළු ඉඩමම / මුළු කැබැල්ලම ආවරණය වන ලෙස 10(1) තීරණය නිකුත් කිරීම - Issue 10(1) decision for whole land/particular land lot
- අයිතිය තහවුරු කළ නොහැකි අවස්ථාවක 10(1) ආ යටතේ අයිතිය පිළිබඳ ආරවුල දිසා අධිකරණය වෙත යොමු කිරීම -In cases where ownership cannot be verified, referring the ownership dispute to the District Court under Section 10(1)(b).
- තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තොරතුරු යොමුකර තක්සේරුව ලබා ගැනීම -Sending details to the Valuation Department for the purpose of obtaining the valuation.

15 වගන්තිය යටතේ දැන්වීම - Notice under section 15

ඉඩමට හිමිකම් කියන්නන් නොපැමිණිවිට වන්දි සඳහා හිමිකම් පරීක්ෂණය කල් දැමීම - Postponing the ownership inquiry for compensation if the claimants do not appear

නැවත පරීක්ෂණය පැවැත්වෙන දිනය සඳහන් කරමින් 15 වගන්තිය යටතේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම -Issuing notifications under Section 15 specifying the date for the re-inquiry

- කල් තැබූ දිනයේ පරීක්ෂණයට පෙනී නොසිටියහොත් වන්දි ගෙවීම සම්බන්ධ තීරණය ගැනීම -Making a decision regarding the payment of compensation if the claimant fails to appear on the scheduled date of inquiry.

17 වගන්තිය යටතේ තීරණය - Decision under section 17

අයිතියක් ඇති පාර්ශවයන් වෙත හිමි වන වන්දි මුදල පිළිබඳව තීරණය -Decision on the amount of compensation for parties holding ownership rights

- 17 තීරණය නිකුත් කිරීමේදී ඉඩමේ අයිතිය, ප්‍රමාණය, හිමිකමේ ස්වභාවය, වන්දි හිමිකරුවන් හා වන්දි මුදල බෙදී යන ආකාරය දැක්වීම -When issuing a decision under Section 17, specifying the land ownership, extent, nature of ownership, the parties entitled to compensation, and the manner of distribution of the compensation amount
- අයිතිකරුවන් ඉල්ලූ මුදලට වඩා වැඩි මුදලක් වන්දි වශයෙන් ගෙවිය නොහැක - Amount of compensation should not exceed amount claimed by the claimant

වන්දි සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම - Appeal to the Compensation Review Board –Section 22

- තමන්ට ප්‍රදානය කළ වන්දි මුදල පිළිබඳ සෑහීමකට පත් නොවූ අයකුට අභියාචනා කළ හැක. - Anyone who is unsatisfied with the compensation paid to him, can appeal against such a decision.
- වන්දි සමාලෝචන මණ්ඩල පරීක්ෂණයට ප්‍රාදේශීය ලේකම් හා ප්‍රධාන තක්සේරුකරු සහභාගී වේ -Participation of the Divisional Secretary and Chief Valuer in the compensation review board proceedings.
- එහි තීරණය අවසානාත්මක වේ - Its decision is final.

වන්දි ගෙවීම / වන්දි අත්හැරීම / හුවමාරු කිරීම - Paying Compensation/Renounce the compensation/ Exchanging

- 17 තීරණය නිකුත් කිරීමෙන් පසු හෝ වන්දි සමාලෝචන මණ්ඩලයේ තීරණය ලද පසු වන්දි ගෙවීම - Payment of compensation after the issuance of a Section 17 decision or following the decision of the Land Acquisition Review Board (Section 29)


- ඉඩම පරිත්‍යාග කරන අයගෙන් 34(1) වගන්තිය යටතේ වන්දි අත්හැරීමේ ප්‍රකාශය අත්සන් ගැනීම - Obtaining the signature of the person donating the land on a declaration of waiver of compensation under Section 34(1)

- විකල්ප ඉඩමක් 36 වගන්තිය යටතේ ලබාදීම -Providing an alternative land under Section 36

වන්දි ගෙවීම - Payment of Compensation

මේ සඳහා **දීමනා ලේඛණය** (ජී.ඒ.එල්.8) නඩත්තු කරන්න.

Maintain the Awards Register (G.A.L. 8) for this purpose.



දීමනා ලේඛණය

AWARDS REGISTER

38 (අ) ආඥාව - 38(a) order

38 ආඥාව නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කිරීම

අත්කරගත් ඉඩමේ භුක්තිය රජය වෙත ලබාගැනීම සඳහා ආඥාවක් නිකුත් කිරීම - issue an order to take over the possession of the land acquired to the State

- සම්පූර්ණයෙන්ම වන්දි ගෙවා අවසන් වූ පසු ප්‍රාදේශීය ලේකම් විසින් 38 (අ) ආඥාව ඉල්ලුම් කිරීම - After completing the compensation, the Divisional Secretary requests 38 (a) order

- 38 (අ) ආඥාව ගැසට් පත්‍රයේ පළ කිරීම - Publishing the 38(a) order in gazette

ඉඩම හා පරවශකාවය

38 (අ) - ඉඩම

38(ආ) - පරවශකාවය

භූක්තිය භාරගැනීම හා භාරදීම- Taking over/Handing over the possession

- අත්කරගැනීමේ නිලධාරී විසින් හිමිකරුගෙන් භූක්තිය භාරගෙන ඉල්ලුම්කාර ආයතනය වෙත භාරදීම - Acquiring officer Takes the possession from claimant and hand over to the applicant institution
- භූක්තිය භාර නොදෙන අවස්ථාවක 42(2) යටතේ මහේස්ත්‍රාත් වෙත යොමු කර පිස්කල් නියෝග මත ක්‍රියා කිරීම - Where possession is not given, the matter shall be referred to the Magistrate under Section 42(2) and executed as per the court's orders.
- භූක්තිය භාරගත් ඉඩමේ රජයේ අයිතිය ලියාපදිංචි කිරීම -Recording the State's title over the land after possession has been taken
- අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා රජයේ ඉඩම් ආඥාපනත යටතේ දෙපාර්තමේන්තු පැවරීම් සිදුකිරීම - Vesting lands under the State Land Ordinance for Ministries and Departments
- ව්‍යවස්ථාපිත ආයතන සහ පළාත් පාලන ආයතන සඳහා 44(1) වගන්තිය යටතේ පැවරුම් සහතික ලබාදීම - Issue vesting of Certificates under Section 44 (1) for Statutory Bodies and Local Authorities

භුක්තිය හාරගත් ආයතනයේ වගකීම

1. අත්කරගත් අරමුණට ඉඩම භාවිතා කිරීම
2. අනවසරකරුවන්ගෙන් ඉඩම ආරක්ෂාකර ගැනීම.

රජයේ අයිතිය ලියාපදිංචි කිරීම සහ පැවරුම් සහතික නිකුත් කිරීම
Government ownership registration and issuance of transfer certificates

- අත්කරගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු අත්කරගත් ඉඩමක රජයේ අයිතිය ලියාපදිංචි කළ යුතුය.
  Once the acquisition process is complete, the government's ownership of the acquired land must be registered.
- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා රජයේ ඉඩම් ආඥාපනත යටතේ පැවරුම් සහතිකයක් නිකුත් කිරීම
  Issuance of a transfer certificate under the Government Lands Ordinance for Ministries and Departments
- සංස්ථා, මණ්ඩල වැනි ව්‍යවස්ථාපිත ආයතන හා පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා 44 වගන්තිය යටතේ පැවරුම් සහතිකයක් නිකුත් කළ යුතුය

  A certificate of transfer under section 44 must be issued for statutory bodies such as corporations, boards and provincial councils and local government bodies.

44 වගන්තිය යටතේ පැවරුම් සහතිකයක් නිකුත් කිරීමේදී සැලකිය යුතු කරුණු

Matters to be considered when issuing a transfer certificate under Section 44

1. වන්දි මුදල් ගෙවා ඇත්තේ එම ආයතනයේ ප්‍රතිපාදනවලින්ද යන්න
   Whether the compensation was paid from the funds of that institution

2. 44 සහතිකය නිකුත් කළ යුත්තේ අත්කරගැනීම අවසන් වීමෙන් පසුව පමණි
   44 The certificate should be issued only after the acquisition is completed.

3. 44 සහතිකය සඳහා කොන්දේසි ඇතුලත් කිරීම
   44 Including conditions for the certificate

38 අතුරුවිධාන ආඥාව - 38 (a) Proviso

ඉඩම කඩිනමින් අත්කරගැනීමට හදිසි අවශ්‍යතාවක් පවතීනම් 38’අ’ අතුරු විධාන ආඥාව නිකුත් කිරීම සිදුකරයි - If there is an urgent need to take over the possession of the land, the 38(a) Proviso is issued.

- 2 හෝ 4 වගන්ති නිකුත් කර තිබීම සහ මැනුම්පතිගේ පිඹුරක් තිබීම අත්‍යවශ්‍ය වේ - Completion of section 2 or 4 and having a proper plan of survey general
- වන්දි මුදලට අමතරව 7% බැගින් පොළී මුදලක් ගෙවීමට සිදුවීම - In addition to the amount of compensation interest of 7% has to be paid

50 වගන්තිය යටතේ අත්කර ගැනීම අත්හැර දැමීම - Abandonment of acquisition procedure

- 38 ආඥාව/අතුරු විධාන ආඥාව නිකුත් කිරීමට පෙර 2/4 නියමයෙන් ඇරඹූ අත්කර ගැනීමක් 50 වගන්තිය යටතේ අත්හැර දැමිය හැක.
- An acquisition commenced with section 2 or 4 can be abandoned under the section 50 before issuing 38(a) order or 38 (a) proviso

අවසතු කිරීම සහ ප්‍රත්‍යදිෂ්ඨ කිරීම - Divesting and Revocation of the vesting order

ඉඩම අත්කරගත් කාර්යය සඳහා තවදුරටත් භාවිතා නොවේනම් අවසතු කිරීම හෝ ප්‍රත්‍යදිෂ්ඨ කිරීම සිදුකරයි. එවිට ඉඩම කිසි විටක රජයට නොපවරන ලද්දක් සේ සලකයි - If it is no longer used for the acquired purpose, order on Divesting /Revocation of the vesting order can be issued, Then the land would never considered to have been vested to the state.

අවසතු / ප්‍රත්‍යදිෂ්ඨ කිරීමට සැපිරිය යුතු අවශ්‍යතා - Requirements

- වන්දි/පොලී කොටසක් හෝ ගෙවා නොතිබීම - No full or partly payments of compensation/interest
- ඉඩම පොදු කාර්යයක් සඳහා භාවිතා කර නොතිබීම - The land has not been used for the acquired purpose
- ඉඩම රජයේ මුදලින් සංවර්ධනය කර නොතිබීම - The land has not been developed using public funds

අවසතු කිරීමේදී - when divesting,

- අවසතු කිරීමෙන් පසු ඉඩම භාරගැනීමට හිමිකරු දිවුරුම් ප්‍රකාශයකින් එකඟ වී තිබීය යුතුය - Land owner should agree by an affidavit to take over the land after divesting
- අත්කරගත් ඉඩමකින් කොටසක් අවසතු කළ හැකිවීම - A portion of acquired land can be divested

වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කිරීම (33 වගන්තිය) - Compensation paying to court (Section 33)

- කිසිවෙකුත් හිමිකම් ඉදිරිපත් නොකළ විට -Where no ownership is claimed by any person
- වන්දිලාභියා සොයාගත නොහැකිවීම - Claimant can not be found after a diligent searching
- වන්දිලාභියා මියගොස් ඇති විට - Claimant is dead
- ප්‍රදානය කළ වන්දි මුදල භාරගැනීම වන්දිලාභියා විසින් ප්‍රතික්ෂේප කළ විට -When the recipient refuses to accept the compensation.
- හිමිකම්ලත් තැනැත්තා කවුරුන්දැයි නොදන්නා විට - When the owner of the property is unknown

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය National Involuntary Resettlement Policy - NIRP

නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතින් විධි විධාන සලසා ඇත - Resettlement process has established by National Environment Act No 47 of 1980

නීතිමය රාමුව - Legal Framework

- ඉඩම් අත්කරගැනීමේ පනත - Land Acquisition Act
- ජාතික පාරිසරික පනත- National Environment Act
- නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත අවස්ථාවලට බලපාන අනෙකුත් නීති රීති හා අණ පනත් (උදා - නාගරික සංවර්ධන පනත, වෙරළ සංරක්ෂණ පනත) – Certain laws and regulations (Eg- UDA Act, Coastal conservation act) that have a bearing on planning and implementing the NIRP in specific circumstances.

වන්දි ගෙවීමේ ක්‍රමවේදය - Compensation schemes

- 2009 අප්‍රියල් 07 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද **ඉඩම් අත්කරගැනීමේ 2008 රෙගුලාසි**

  Land Acquisition Regulations of 2008 published in gazette of 07th April, 2009
- 2014 මැයි 30 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද **ඉඩම් අත්කරගැනීමේ 2013 රෙගුලාසි**

  Land Acquisition Regulations of 2013 published in gazette of 30th May, 2014

සැලකිය යුතු කරුණු Notable points

1. අත්කරගත් ඉඩමක් එම අත්කරගත් අරමුණ සඳහා පමණක් යොදාගත යුතුය
   Acquired land should be used only for the purpose for which it was acquired.
2. නිවැරදි ආකෘතිපත්‍ර භාවිතා කිරීම සහ එම ආකෘතිපත්‍ර නිවැරදි ලෙස සම්පූර්ණ කිරීම
   Using the correct forms and completing them correctly
3. 7 වගන්තිය යටතේ කටයුතු කිරීමේදී 7 වගන්තිය යටතේ ගැසට් පත්‍රය ශුද්ධි පත්‍රිකාවක් මගින් පමණක් සංශෝධනය කළ යුතුය - When acting under Section 7, the Gazette must be amended only through a correction notice under Section 7ඟ

Q & A

ස්තුතියි...!

Thank You...!